සැ. යු. -2009.09.11 වැනි දින පළ වූ අංක 1,619 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,620 - 2009 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2009.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 1388 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1389 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1396 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 සැප්තැම්බර් මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 සැප්තැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# වෙනත් පත්කිරීම් ආදිය

2009 අංක 279

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපති විසින් අනුමත කරන ලද උසස්වීම

2009 ජූලි මස 06 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්ලයිට් ලෙප්ටිනන්ට් නිළයට

ෆ්ලයින් ඔෆිසර් ප්‍රසාද් ඉන්දික සමරවීර (වී/0500) - පරිපාලන අධ්‍යාපන

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් චීෆ් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

කොළඹ දී ය.

09-615/2

2009 අංක 280

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපති විසින් අනුමත කරන ලද උසස්වීම්

2006 ජූලි මස 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්ලයින් ඔෆිසර් නිළයට

ෆ්යිලට් ඔෆිසර් ප්‍රසාද් ඉන්දික සමරවීර (වී/0500) - පරිපාලන අධ්‍යාපන

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් චීෆ් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

කොළඹ දී ය.

09-615/1

---

2009 අංක 281

**අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 108 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ වන මම පහත නම් සඳහන් මහත්ම මහත්මීන් අදාළ හදිසි මරණ පරීක්ෂක කොට්ඨාස සඳහා හදිසි මරණ පරීක්ෂකවරුන් වශයෙන් ද එම ධුරය දරන තාක් කල් අදාළ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරුන් වශයෙන් ද පහත උපලේඛනයේ දැක්වෙන පත්වීම් දින සිට පත් කරමි :

මිලින්ද මොරගොඩ,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2009 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දී ය.

| | *නම* | *ලිපිනය* | *පත්වීම් දිනය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *අධිකරණ කලාපය* |
|---|---|---|---|---|---|
| 01. | ඩබ්. ජී. අයි. එස්. කුමාර මහතා | අංක 207, කොස්කඳවල, යක්කල | 2009.01.01 | වීරගුල | ගම්පහ |
| 02. | ඒ. එස්. එම්. අර්ෆාන් මහතා | අංක 28, මහවත්ත, අටුලුගම, බණ්ඩාරගම | 2009.05.25 | බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (මුස්ලිම්) | කළුතර |
| 03. | අයි. එල්. එම්. ඉප්ලාල් මහතා | අංක 66ජී, ගලදෙනිය, උඩතලවින්න මඩිගේ | 2009.03.01 | කුණ්ඩසාලේ/මැණික්හින්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (මුස්ලිම්) | මහනුවර |
| 04. | කේ. ඉසදීන් මහතා | අංක 383/7, කොලොන්නාව පාර, කොලොන්නාව | 2009.05.25 | කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (මුස්ලිම්) | කොළඹ |
| 05. | එච්. එම්. ජී. දේවින්ද ඒකානායක මහතා | අංක 62/2, අරංගල, නාවුල | 2009.04.20 | වගපනහ උඩසියපත්තුව | මාතලේ |
| 06. | ඒ. එම්. එම්. යූ. බණ්ඩාර මහතා | අංක 80, මානින්ගමුව, පල්ලේපොල | 2009.05.11 | උඩුගොඩ උඩසියපත්තුව බටහිර | මාතලේ |

| | නම | ලිපිනය | පත්වීම් දිනය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අධිකරණ කලාපය |
|---|---|---|---|---|---|
| 07. | එල්. කේ. ආර්. ගීතා කුමාරි මහත්මිය | අංක 86, බස් නැවතුම්පොළ, ගිනිගත්හේන | 2009.03.01 | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (මුස්ලිම්) | නුවරඑළිය |
| 08. | ඒ. ආර්. ඒ. මවාහිබ් මහතා | අංක 77, ෆාතිමා විලා, මල්වාන නගරය, මල්වාන | 2009.07.30 | බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (මුස්ලිම් | ගම්පහ |

09-720

# රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියෙන් දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2009 අගෝස්තු මස 27 වැනි දින,
අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (01) 41267 | පීටර්වාස් ජාන් ආයුබ් ජාන් මයා, සභාධිපත්‍ය ඒකක අංක 1, අංක 4/1, 4 වැනි මහල, ලිබර්ටි ප්ලාසා සංකීර්ණය, කොළඹ 03 | විදාන ආරච්චිලාගේ වාසක ප්‍රසාද්, ජයතිලක මයා අංක 419/38, ඇඹරලුව, වැලිවේරිය |
| (02) 41281 | හොරතල්පේඩිගේ ගෙදර චන්ද්‍රසිරි මයා, අංක 175බී, උඩුරත්මීවල, මැණික්දිවෙල | නාරන්ගෙදර නීටා රාජපක්ෂ මිය, අංක 149, උඩරත්මීවල මැණික්දිවෙල |
| (03) 41070 | කොළඹගේ දොන් වාසක දුෂ්‍යන්ත මයා, අංක 41/33බී, ඩී. එම්. කොළඹගේ මාවත, කිරුළපන, කොළඹ 05 | කොඩිකාරගේ නිරෝෂන් රංජිත් කුමාර මයා, අංක 166/13, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ |
| (04) 41283 | 01. ජයසිංහ ආරච්චිගේ සුනිල් සරත් මයා, 02. හේරත් සඳරත්න කුමුදාවතී මිය, වැව පාර, බෝතලේගම, ලුණුවිල | රණබාහු මුදියන්සේලාගේ පුෂ්ප කුමාරසිංහ මයා, රබර්වත්ත, කහටවිල පොතුවටන |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (05) 41295 | සියඹලාපිටියගේ දෝන වයලින් සවර්ණලතා මිය, අංක 31/ඩී, දවටගහවත්ත, වත්තල | කංකානි තන්ත්‍රි රංජිත් ලක්ෂ්මන් කරුණාතුංග සිල්වා මයා, අංක 2/11, විගඩ, බෙම්මුල්ල |
| (06) 41299 | ගිංතොට සරුක්කාල පටබැඳිගේ විමලදාස මයා, ඉඩම්වත්ත, කුඩාවැල්ල, නාකුළුගමුව | කලු හැන්නදිගේ රමණී මිය, (නැගෙනහිර කුඩාවැල්ල), කන්දෙගොඩ, කුඩාවැල්ල, නාකුළුගමුව |
| (07) 41307 | මල්ලිකා ආරච්චිගේ සෝමලතා මිය, අංක 148/2/1/ඒ, බටහේන පාර, සූරිගම, කඩවත | හලහප්පෙරුම ආරච්චිගේ මෝවින් දිලිප් ෆොන්සේකා මයා, අංක 119/ඒ/2, මහර නුගේගොඩ රාගම |
| (08) 41315 | වීරවධන පටබැඳිගේ ජයලත් සිරිලාල් ප්‍රනාන්දු මයා, අංක 29, ශ්‍රී පේමරතන මාවත, මොරටුමුල්ල, මොරටුව | උඩවත්තගේ දොන් රෝහණ සිරිදත් මයා, අංක 71, "ශ්‍රියාවාස", ජයමාවත, මාම්පේ පිළියන්දල |
| (09) 41317 | කන්නන්ගර කෝරාලලාගේ චාන්දනී කන්නන්ගර මිය, අංක 423, දොරණගොඩ, උඩුගම්පොල | විජේසුන්දර ලේකම්ලාගේ දයාවතී විජේසුන්දර මිය, අංක 34/1, පිටියේගෙදර, බේම්මුල්ල |
| (10) 41321 | ඉලන්ගකෝන් පතිරණගේ ලෙස්ලි රේමන් චිත්‍රානන්ද මයා, අංක 84/1, හංසගිරි පාර, වලව්වත්ත, ගම්පහ | අත්තනායකගේ රොහාන් ක්‍රිස්ටෝෆර් ප්‍රානන්දු මයා, අංක 128/1, නුවර පාර, යක්කල |
| (11) 41322 | මුතුනමගොන්නගේ චාන්දනී ඇනට් සුනේත්‍රා මිය, අංක 25, සූරිය උයන, දුම්මලසූරිය | රතුගමගේ ලීනස් හියුබට් ප්‍රනාන්දු මයා, පැබ්බෝනියා මාවත, වෙන්නප්පුව |

09-488

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/මහ/79.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්තිය යටතේ සාදන ලද 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ)(ඇ)(ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මහනුවර දිස්ත්‍රික්කයේ හරන්කහව පතිරාදයෙහි පිහිටි මහ/ශ්‍රී සංඝානන්ද මූලික පිරිවෙන 2009.01.01 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය අලවත්තේගම ධම්මතිලක ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6)(අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 26 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපායේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

09-640/2

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/මො/19.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්තිය යටතේ සාදන ලද 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ)(ඇ)(ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මොනරාගල දිස්ත්‍රික්කයේ පාලරුව, පොකුණුගල, පුරාණ විහාරයේ පිහිටි සිරිධම්ම තිලක මූලික පිරිවෙන 2009.01.01 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය පානමයායේ සෝමානන්ද ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6)(අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 26 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපායේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

09-640/1

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/බ/38.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ)(ඇ)(ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ, නිකපොත පිහිටි ශ්‍රී රතනජෝති මූලික පිරිවෙන 2008.01.01 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය නිකපොත, නන්දරතන ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6)(අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 26 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපායේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

09-640/3

---

**වන්දනා ගමන් ආඥාපනත**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරිය වූ ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ආචාර්ය සරත් අමුණුගම (පාම),
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2009 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග රොටුඹ පෙත්මග රජමහා විහාරස්ථ ඇසල මහා දළදා මහා පෙරහැර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. *මේ නියෝගවල-*

"කඳවුරු පෙදෙස", යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද ඇතුළත් වේ. තවද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ රොටුඹ පෙත්මග රජමහා විහාරස්ථ රොටුඹ ඇසල මහා දළදා මහා පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියෙකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතකු හෝ කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතුය.

එසේ වුවද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කා ගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන්කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීප වන වන්දනාකරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිගමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුණ්‍ය කටයුතු සඳහා තාවකාලික මඩු ඉඳි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;

(ඓ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහා දැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකි ය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වළක්වා ගැනීම සඳහා කඳවුරු පෙදෙස තුළ, යම් වැවකට ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කළ හොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසි වලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරුවල පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2). යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් බාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාරදෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව, හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද එය ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මල මුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතුය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇලක, දොලක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැසිකසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැලිකසල දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතුය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභොජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් තහනමට ගෙන විනාශ කරන දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක

බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයා හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතුය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධාරියා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත් වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතුය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක අනාවරණයව නොතැබිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය කසල හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසල පොළවේ විසි කොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක් , භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2 කට (ඝන අඩි 4 1/2 ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසල බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසල තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසල ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතුය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝගවල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීමද ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගී කරගතයුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් අසාදන රෝගයක් හෝ ස්පර්ෂක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්මද එසේ යම් අසාදන රෝගයක් හෝ ස්පර්ෂක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක්මද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් මිස භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන බෙදාහැරීමේදී, විකිණීමේදී, හෝ නිෂ්පාදනය කිරීමේදී හෝ සහභාගිවීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතුය.

25. යම් බේකරියක කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන් පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ෂක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍ර ධාරි විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිණිකෙළි භාණ්ඩ හෝ ගිනිඅවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින් :-

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

30. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් :-

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක් ;

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් සහ ;

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් ඕනෑම වේලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රොටුඹ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රොටුඹ පෙත්මග රජමහා විහාරය පිහිටි භූමි භාගය,

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| උතුරට | : දෙන්කන්දලිය, කුඩුම්රියන් කන්ද දොළ, මොලොග්ගමුව ගම මායිම, |
| දකුණට | : ගල්කැටිකන්ද, කරච්කැටිය දෙනිය, රොටුඹු ජනපදය ගම මායිම, |
| නැගෙනහිරට | : පස්ගොඩ, පොතුහැල්ගොඩ මාර්ගය, පස්ගොඩ ජනපදය මාර්ගය මායිම, |
| බස්නාහිරට | : අම්පනාගල දියනාන ඇළ, පනාකඩු දියදාව ගම මායිම. |

09-667

---

### සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා හෙද සභාව ස්ථාපිත කිරීම සඳහා සාමාජිකයින් තෝරා පත්කර ගැනීමට නාම යෝජනා කැඳවීම

1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත හා 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ ද විධිවිධාන පරිදි ශ්‍රී ලංකා හෙද සභාව ස්ථාපිත කිරීම සඳහා සාමාජිකයන් තෝරා පත්කර ගැනීමට මෙමගින් නාමයෝජනා කැඳවනු ලැබේ.

01. මේ සමග පළකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව පිළියෙල කරගත් නාමයෝජනා ඉල්ලුම්පත්‍ර මගින් නාමයෝජනා ඉදිරිපත් කළ යුතු ය.

02. සියලුම නාමයෝජනා 2009 ඔක්තෝබර් මස 30 වැනි දින පස්වරු 2.00ට පෙර මෙහි පහත සඳහන් අයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් ඉදිරිපත් කළ යුතුය. නාමයෝජනා පත් බහා එවනු ලබන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා හෙද සභාව සඳහා නාමයෝජනා" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අධ්‍යක්ෂිකා (හෙද අධ්‍යාපන),
අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකය,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
කොළඹ 10.

03. අසම්පූර්ණ නාමයෝජනා පත්‍ර හා නියමිත දිනට පසුව ලැබෙන නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබෙයි.

04. සියලුම නාම යෝජනා පත්‍ර ඒ පිළිබඳව සැළකිල්ලක් දක්වන්නන්ගේ පරීක්ෂණය සඳහා 2009.11.06 වැනි දින පෙරවරු. 10.00 සිට පස්වරු 3.30 දක්වා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා (හෙද අධ්‍යාපන) කාර්යාලයේ දී ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

05. නාමයෝජනාවලට විරෝධතා 2009.11.10 වැනි දින පස්වරු 3.30ට පෙර අධ්‍යක්ෂිකා (හෙද අධ්‍යාපන) වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

06. ඡන්දය පැවැත්වෙන ස්ථානය, දිනය හා වේලාවන් පසුව නිවේදනය කරනු ඇත.

07. එක් සාමාජිකයෙකු/සාමාජිකාවක පමණක් තෝරා පත්කර ගත යුතු ක්ෂේත්‍රවල හෙද හෙදි නිලධාරීන්ට එක් ඡන්දයක් පමණක් හිමිවනවා ඇත.

සාමාජික/සාමාජිකාවන් පස් දෙනෙකු (05) තෝරාපත් කරගත යුතු රෝහල් ක්ෂේත්‍රයේ හෙද හෙදි නිලධාරීන්ට ඡන්ද පහක් (05) හිමිවන අතර, එක් අපේක්ෂකයෙකුට එක් ඡන්දයක් බැගින් පමණක් පාවිච්චි කළ යුතු ය.

හෙද සේවාවේ II පන්තියේ (ආ) II පන්තියේ (අ) සහ අධිසේවක I පන්තියේ හෙද හෙදි නිලධාරීන් ඉහත කී රෝහල් සේවාවේ සාමාජික/සාමාජිකාවන් 05 දෙනෙකු තෝරාපත් කරගැනීම සඳහා ඉහත දක්වා ඇති පරිදි ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ලබනු ඇත.

08. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හා පළාත් ආයුර්වේද රෝහල් හි සේවයේ නියුතු සියලුම කාණ්ඩවල හෙද හෙදි නිලධාරීන්ට ආයුර්වේද ක්ෂේත්‍රය සඳහා සාමාජිකයකු/සාමාජිකාවක් තෝරාපත් කරගැනීමට ඡන්දය හිමිවනවා ඇත.

09. ඡන්ද හිමිකම් ලැබීමට තම නම මෙතෙක් ඡන්ද නාමලේඛනයට ඇතුළත් කිරීමට ඉල්ලා නොමැති හෙද හෙදියන් විසින් 2009.10.30 වැනි දින පස්වරු 2.00ට පෙර තම නම, ශ්‍රේණිය, ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයේ හෙදියක ලෙස ලියාපදිංචි අංකය සමග එම සහතික පිටපත සහිතව තම ඉල්ලීම ආයතන ප්‍රධානියා මගින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා (හෙද අධ්‍යාපන) වෙත ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු ය.

10. ශ්‍රී ලංකා හෙද සභාව සංස්ථාපනය කිරීම සඳහා සාමාජික/ සාමාජිකාවන් තෝරා පත්කර ගැනීම පහත සඳහන් පරිදි සිදු කෙරෙනු ඇත :

10.1 හෙද පරිපාලනය පිළිබඳ අවුරුදු 05 පළපුරුද්දක් ඇතුළු අවුරුදු 12කට නොඅඩු කාලයක් හෙද වෘත්තියෙහි පළපුරුද්දක් ඇත්තාවූ ද සහ හෙද පරිපාලනය පිළිබඳ නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවාවූ ද, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, වෘත්තියෙ හි යෙදී සිටින්නා වූ ද, සෞඛ්‍ය අමාත්‍යංශයේ සහ පළාත් රාජ්‍ය සේවාවේ, වෛද්‍ය සේවාවේ (රෝහල්) නියුතු නිලධාරීන් අතුරෙන් සෞඛ්‍ය අමාත්‍යංශයේ සහ පළාත් රාජ්‍ය සේවාවේ, වෛද්‍ය සේවාවේ (රෝහල්) විශේෂ ශ්‍රේණිය හා I පන්තියේ හෙද හෙදි නිලධාරීන්ගේ ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන විශේෂ ශ්‍රේණියේ හෝ I පන්තියේ එක් සාමාජිකයෙක්/සාමාජිකාවක් .........01

10.2 අවුරුදු 12කට නොඅඩු කාලයක් හෙද පාසලක ඉගැන්වීමෙහි හෝ පරිපාලනයෙහි පළපුරුද්දක් ඇත්තාවූ ද සහ නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවාවූ ද, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද සෞඛ්‍ය අමාත්‍යංශයේ හා පළාත් රාජ්‍ය සේවයේ හෙද අධ්‍යාපන අංශයේ හෙද හෙදි නිලධාරීන් අතරින් සෞඛ්‍ය අමාත්‍යංශයේ හා පළාත් රාජ්‍ය සේවාවේ හෙද අධ්‍යාපන අංශයේ විශේෂ ශ්‍රේණියේ හා 1 වැනි පන්තියේ හෙද හෙදි නිලධාරීන්ගේ ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන විශේෂ ශ්‍රේණියේ හෝ I පන්තියේ එක් සාමාජිකයෙක්/සාමාජිකාවක් .........01

10.3 මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවුරුදු 12කට නොඅඩු කාලයක පළපුරුද්දක් ඇත්තාවූ ද නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවා වූ ද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද සෞඛ්‍ය අමාත්‍යංශයේ හා පළාත් රාජ්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හෙදි නිලධාරීන් අතරින් සෞඛ්‍ය අමාත්‍යංශයේ හා පළාත් රාජ්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශේෂ ශ්‍රේණියේ හා I පංතියේ හෙදි නිලධාරීන් විසින් තෝරා පත්කර ගනුලබන විශේෂ ශ්‍රේණියේ හෝ I පන්තියේ එක් සාමාජිකාවක් .........01

10.4 පළාත් රාජ්‍ය සේවාවේ සේවයේ නියුක්තව සිටින්නා වූ ද, අවුරුදු 12කට නොඅඩු කාලයක් හෙද වෘත්තියෙහි පළපුරුද්දක් ඇත්තා වූ ද, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇත්තා වූ ද අය අතරින් පළාත් රාජ්‍ය සේවයේ හෙද නිලධාරීන් විසින් තෝරා පත්කර ගනු ලබන එක් සාමාජිකයෙක්/ සාමාජිකාවක් .........01

10.5 අවම වශයෙන් අවුරුදු 05ක හෙද වෘත්තියේ යෙදීමේ පළපුරුද්දක් ඇති සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද, සෞඛ්‍ය අමාත්‍යංශයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හෙද හෙදියන් අතරින් (II පන්තියේ "ආ" (II) පන්තියේ "අ" කාණ්ඩ සහ I පන්තියේ අධි ශ්‍රේණියේ) සෞඛ්‍ය අමාත්‍යංශයේ හා පළාත් රාජ්‍ය සේවාවේ මාණ්ඩලික හෙද හෙදි නිලධාරීන් විසින් තෝරා පත්කර ගනු ලබන සාමාජික/සාමාජිකාවන් .........05

10.6 ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හා පළාත් සභාවල ආයුර්වේද ආරෝග්‍ය ශාලාවල වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහ පළාත් සභාවල ආයුර්වේද ආරෝග්‍ය ශාලාවල නියුතු හෙද හෙදි නිලධාරීන් විසින් තෝරා පත්කර ගනු ලබන පළාත් රාජ්‍ය සේවයට අයත් එක් සාමාජිකයෙක්/ සාමාජිකාවක් .........01

10.7 පෞද්ගලික අංශයේ හෙද හෙදි නිලධාරීන් විසින් තෝරා පත්කර ගනු ලබන ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි ව ඇත්තා වූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද, හෙද හෙදියන් අතරින් එක් සාමාජිකයෙක්/සාමාජිකාවක් .........01

වෛද්‍ය නිහාල් ජයතිලක,
ලේකම් (වැ. බ.),
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යංශය.

**සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යංශය**

***1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත හා 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනත, යන පනත් යටතේ වූ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා හෙද සභාවේ සාමාජිකයෙකු/සාමාජිකාවක් ලෙස පත්වීම සඳහා නාමයෝජනා ඉල්ලුම් පත්‍රය***

පහත සඳහන් විස්තර දක්වා ඇති මා ශ්‍රී ලංකා හෙද සභාවේ සාමාජිකයෙක්/ සාමාජිකාවක් ලෙසට තෝරා පත්කර ගැනීමට මාගේ මනාපය මින් පළ කරන අතර, ඒ සඳහා වූ මාගේ නාමයෝජනාව මේ සමග ඉදිරිපත් කරමි.

ම විසින් පහත දක්වා ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මින් සහතික වන අතර, අසත්‍ය හා වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම තුළින් මාගේ නාමයෝජනාව ප්‍රතික්ෂේප වන බව ද මා දනිමි :

01. සම්පූර්ණ නම :—————.
02. මුලකුරු සමග නම :—————.
03. ස්ථිර ලිපිනය :—————.
04. වර්තමාන රාජකාරි ලිපිනය :—————.
05. හෙද පුහුණුවට ඇතුළත් වූ දිනය හා හෙද විදුහල :—————.
06. පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුව සමත් වූ වර්ෂය හා දිනය :———.
07. පළමු පත්වීමේ වර්ෂය හා දිනය :—————.
08. වර්තමාන ශ්‍රේණියට පත් වූ වර්ෂය, දිනය හා තනතුර :—————.
09. උපන් දිනය :—————.
10. හෙදියක/හෙදවරයෙකු ලෙස වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය :—————.
11. අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් :—————.

මෙයට
විශ්වාසී,
—————.

දිනය :—————.

(ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හෙදියක ලෙස ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)

**යෝජනා ස්ථිරය**

ඉහත .......................................................................................................මහතා/මහත්මිය/මෙනවියගේ නාම යෝජනා ඉල්ලුම් පත්‍රය මින් යෝජනා කොට ස්ථිර කරමු.

| *යෝජනාකරු* | *ස්ථිරකරු* |
|---|---|
| නම :—————. | නම :—————. |
| ශ්‍රේණිය/තනතුර :—————. | ශ්‍රේණිය/තනතුර :—————. |
| සේවා ස්ථානය :—————. | සේවා ස්ථානය :—————. |
| වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :—————. | වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :—————. |
| අත්සන :—————. | අත්සන :—————. |
| දිනය :—————. | දිනය :—————. |

(ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හෙදියන් ලෙස ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය)

නාමයෝජනා පත්‍රය පිළිගන්නා ලදී./ප්‍රතික්ෂේප කරන ලදී.

හේතු ඃ

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

:—————.
නාමයෝජනා භාර ගැනීමේ නිලධාරී.

දිනය :—————.

09-674

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - හම්බන්තොට ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය ඃ 0810-01453361-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.10 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ ඃ

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් දීපානි රංගේ විසින් තුනම සහතික කරන ලද 2006 පෙබරවාරි මස 10 දිනැති අංක 722, 2007 මැයි මස 3 දිනැති අංක 868, 2007 මැයි මස 03 වැනි දිනැති අංක 869 සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. අබේගුණවර්ධන විසින් සහතික කරන ලද 2007 පෙබරවාරි මස 8 දිනැති අංක 43 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම අම්බලන්තොට පදිංචි ලලිත් මහානාම දිසානායක යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්දෙලක්ෂ හයදහස් තුන්සිය පනස්එකයි ශත අනූ හයක (රු. 32,06,351.96) මුදලක් 2008 අප්‍රේල් මස 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 32,06,351.96 මුදල ද, 2008 අප්‍රේල් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පය (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 722, 868, 869 සහ 43 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි හා 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමු වැනි උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ උඩබෙරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩබෙරගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. රත්නම් විසින් සාදන ලද අංක 742/02 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන උඩබෙරගමබැද්ද නමැති ඉඩමේ ලොට් 03 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට ඃ අයිඑස්පීපී 7හි සඳහන් ලොට් 321 (ඇල සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට ඃ අයිඑස්පීපී 7හි සඳහන් ලොට් 318 ද, දකුණට ඃ අම්බලන්තොට සිට පහළ බෙරගම දක්වා ප්‍රධාන පාර ද, බස්නාහිරට ඃ එකී අංක 742/02 දරන සැලැස්මේ සඳහන් ලොට් 02 ද යන මායිම් තුළ අක්කර දෙකයි, පර්චස් විසිහතරක් (අ. 2, රූ. 0, පර්. 24)ක් විශාල බිම ගස් වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත්

සියලු දේ සමග ඉඩම. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හම්/24/1162/97ඒ හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ උඩබෙරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බෙරගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. එම්. ජේමසිරි විසින් සාදන ලද අංක 1998.07.26 දිනැති අංක 980717 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඉගිනියගහ ලන්ද නමැති ඉඩමේ ලොට් 02 ලකුණු කළ බෙදා වෙන් කරන ලද රජයේ ඉඩම් කොටස මායිම්, උතුරට : ලොට් 50පී ද, නැගෙනහිරට සහ දකුණට : ඇල සහ බස්නාහිරට : එකී අංක 980717 දරන සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල මාර්ග අයිතීන්, බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හම්/24/1157/87ඊ සහ 87එෆ් හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,
අයකර ගැනීම් නීති.

09-530/1

---

### සෙලාන් බැංකු පීඑල්සී - කොළඹ දකුණ ශාඛාව
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 702583-001.

සෙලාන් බැංකු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.31 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දාවූ ද 2008.04.22 දිනැති සහ අංක 25841 දරන උකස් බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල ගෙවීම හලාවතගේ ගුණවර්ධන පෙරේරා සහ කුරණගේ ලුසීඩා මියුරි පෙරේරා යන අය ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්දෙලක්ෂ හැත්තෑඅටදහස් හයසිය හතලිස් අටයි ශත හතලිස්හතර (රු. 32,78,648.44) ක මුදලක් 2009.04.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 32,78,648.44 ක මුදලට 2009.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 25841 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, නැගෙනහිර වැලිවේරියහි පිහිටි "දවටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. එච්. එම්. බී. පෙරේරා විසින් 2005 ජූලි මස 20 වැනි දින සහ අංක 1313බී දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 1313ට අයත් ලොට් 6ඒ, පිඹුරු අංක 7097/පී ට අයත් ලොට් 1න් ද සහ එම ඉඩමේම ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : පිඹුරු අංක 7097/පී ට අයත් ලොට් 1, 3 සහ 4න් ද සහ පිඹුරු අංක 1538ට අයත් ලොට් 5බී වලින් ද, දකුණට : පිඹුරු අංක 7097/පී ට අයත් ලොට් 8න් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 1313ට අයත් ලොට් 6ඒ වලින් ද සහ එම ඉඩමේම ඉතිරි කොටසින් ද, මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව පර්චස් විසිදෙකයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 22.2) විශාල ඉඩමට අයත් ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළු දේත් සමග පිහිටි ඉඩම ගම්පහ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 819/211 වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ඩී. ඊ. ජේ. ආර්. ද වාස් විසින් 1966 ජූලි මස 18 වැනි දින සහ අංක 7079/පී දරන පිඹුරට අයත් ලොට් 8හි වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-751/3

---

පීවී 7081.

## 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "නාත්තන්ඩිය මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1997.02.13 දින සංස්ථාපිත සමාගමක් වන නාත්තන්ඩිය මිලිස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, නාත්තන්ඩිය මිලිස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-591

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අනුරාධපුර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දාවූ ද 2008.03.07 දිනැති සහ අංක 5267 දරන බැදුම්කර යටතේ අයවිය යුතු මුදල ගෙවීම ඉබ්‍රාහිම් සුරබ්දීන් සහ සෆර්ඩීන්ගේ පාවුසුන් ජනෆ්ඩීන් ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් හයලක්ෂ විසිපන්දහස් අටසිය තිස්පහයි ශත හතලිස්අට (රු. 6,25,835.48) ක මුදලක් 2009.04.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 6,25,835.48 ක මුදලට 2009.05.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5267 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ, කළුකෙලියාව දිසා ලේකම් කොට්ඨාසයෙහි ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 569ට අයත් කටුකෙලියාව හි පිහිටි "රජයේ ඉඩමට" බලයලත් මානක ජේ. ටී, ගලගෙදර විසින් මැන සාදන ලද අංක 2008 ජනවාරි මස 25 වැනි දින සහ අංක 2019 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ප්‍රධාන පාරට වෙන් කරන ලද කොටසින් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : එස්. සුලෙයිමාන්ගේ ඉඩමෙන් ද සහ අඩි පාරට වෙන් කරන ලද කොටසින් ද මායිම් වූ රූඩ් තුන (අ. 0, රූ. 3, පර්. 0) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි බිංදුවයි තුනයි පහ (හෙක්. 0.3035) ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 528/04 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-751/4

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අනුරාධපුර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දාවූ ද 2007.08.15 දින අංක 5033, 2008.03.05 දින අංක 5260 සහ 2008.09.17 දින අංක 5503 (පහත පළමු උපලේඛනයේ විස්තර කරන පරිදි) පරිදි රුපියල් එකොලොස් මිලියන එක්ලක්ෂ තිස්හතරදහස් හත්සිය අනූවයි ශත හැත්තෑනවයක (රු. 1,11,34,790.79) සහ

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2007.01.22 දින අංක 4737, 2007.02.19 දින අංක 4781, 2007.05.17 දින අංක 4914 සහ 2008.01.18 දින අංක 5213 (පහත දෙවන උපලේඛනයේ විස්තර කරන පරිදි) පරිදි රුපියල් හතලිස් පන්ලක්ෂ පහලොස්දහස් තුන්සිය පනස්හතරයි ශත අසූපහ (රු. 45,15,354.85) ක මුදල ඉහත අංක දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සර්ෆඩීන්ගේ පවුසුල් ජනෆ්ඩීන් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පහලොස් මිලියන හයලක්ෂ පනස්දහස් එකසිය හතලිස්පහයි ශත හැටහතර (රු. 1,56,50,145.64) ක මුදලක් 2009.04.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,56,50,145.64 ක මුදලට 2009.05.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5033, 5260, 5503, 4737, 4781, 4914 සහ 5213 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නුවරගම් කෝරළේ, ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 253හි අතුරුවේල්ල නමැති ගමෙහි පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. බී. රත්නසිරි විසින් මැන සාදන ලද අංක 2950 සහ 2007.07.17 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : අයි. එස්. පී. පී. අයි. හි ලොට් 1054 (පාර), නැගෙනහිරට : අයි. එස්. පී. පී. අයි. හි ලොට් 1057 සහ 1053න් ද, දකුණට : අයි. එස්. පී. පී. අයි. හි ලොට් 1053න් ද, (ඇල සමග දිවෙන පාරක් සඳහා වෙන් කරන ලද කොටස) සහ බස්නාහිරට : අයි. එස්. පී. පී. අයි. හි ලොට් 1055න් ද මායිම් වූ රූඩ් දෙකයි පර්චස් විසිපහයි දශම හය (අ. 0, රූ, 2, පර්. 25.6) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම

දෙකයි හයයි හතයි බිංදුව (හෙක්. 0.2670)ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඞී. ඕ 653/117 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ පරිපාලන කොට්ඨාසයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලුත් ගොලුමරදන් කුලමහි පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. බී. රත්නසිරි විසින් මැන සාදන ලද අංක 1740 සහ 2004.07.31 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පාරකට වෙන් කරන ලද කොටසකින් ද, නැගෙනහිරට : ලොට් 2න් ද, දකුණට : ඔමර්ඩීන්ට අයත් ඉඩමෙන් ද, සහ බස්නාහිරට : සරීෆ්ඩීන් නූර්තා හේරා උම්මාට අයත් ඉඩමෙන් ද මායිම් වූ පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි බිංදුවයි හය (හෙක්. 0.0506) ක් විශාල ඉඩම තුල පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 666/155 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

09-751/5

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 311988.

2008 පෙබරවාරි මස 28 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී, එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් 2006 ජූලි මස 28 වැනි දින සහතික කරන ලද්දාවූ ද අංක 8668 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ අදිකාරි මුදියන්සේලාගේ අරුණ නිශාන්ත අදිකාරි ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඑක්ලක්ෂ හතලිස් දෙදහස් දෙසිය හැටහතර (රු. 21,42,264) ක මුදලක් 2007 දෙසැම්බර් මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිඑක්ලක්ෂ හතලිස් දෙදහස් දෙසිය හැටහතර (රු. 21,42,264) මුදලට 2007 දෙසැම්බර් මස 20 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,83,100ක මුදල මත 20%ක වැඩිපුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 8668 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බෙනට් රෙජිනෝල්ඩ් විසින් 1981 අගෝස්තු මස 18 වැනි දින සාදන ලද අංක 3223/ඒ දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ කටුගම්පල හත්පත්තුව දකුණු යටිකහ කෝරළේ, කුලියාපිටිය නගර සභා සීමාව තුළ කුලියාපිටිය ග්‍රාමයේ පිහිටි මාබෙල් ගාඩින්ස් කියන ඉඩමේ ඇති ගොඩනැගිලි, වගාවන්, ගසකොළ සහ භූමිය ඇතුළු සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන කොටසට මායිම්, උතුරට : දිසානායකයගේ ඉඩම ද, නැගෙනහිරට : ඉහත කී අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 5 ද, දකුණට : අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 7 ද සහ බස්නාහිරට : ඉහත කී අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 3 ද යන මායිම් තුළ පර්චස් විසිහතර (අ. 0, රූ. 0, පර්. 24) විශාල ඉඩමේ ලොට් 7 දරන අඩි 20 පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටසේ අළුත්වැඩියා කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ අයිතිය ද, සමග වේ. මෙය කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ (කොට්ඨාස ජේ හි 165 වෙළුමේ 174 පිටුවේ සහ කොට්ඨාස ජේ හි 57 වැනි වෙළුමේ 284 දරන පිටුවේ ලියාපදිංචි ව ඇත.

ආර්. ආර්. දුණුවිල,
සමාගම් ලේකම්.

09-692

---

## මහජන බැංකුව - ජාඇල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2008.05.08 දිනැති අංක 13389 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පොන්ජහෙට්ටි ආරච්චිගේ අසංක දුලාෂ් පෙරේරා සහ පොන්ජහෙට්ටි ආරච්චිගේ ඇන්තනි පෙරේරා යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහතුන් ලක්ෂ අනූහය දහස් දෙසිය හැත්තෑ හතයි ශත පනස් හතර (රු. 13,96,277.54)

ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.06.13 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් දහතුන් ලක්ෂ අනූහය දහස් දෙසිය හැත්තෑ හතයි ශත පනස්හතර (රු. 13,96,277.54) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දහතුන් ලක්ෂ අනූහය දහස් දෙසිය හැත්තෑ හතයි ශත පනස් හතර (රු. 13,96,277.54) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 13389 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ ඒකල කුරුඳුවත්ත ගමේ පිහිටි කෲස්වත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඒ. විජේසිංහ මහතා විසින් 2006.06.05 වැනි දින මැන සකස් කරන ලද පිඹුරු අංක 1726හි ලොට් අංක 39 දරන කොටසට මායිම්, උතුරට : ලොට් 37 සහ ලොට් 31 ද, නැගෙනහිරට : මුලික පිඹුර ගම් 1684හි ලොට් 150 ද, දකුණට : ලොට් 40 ද, බස්නාහිරට : ලොට් 37 සහ 38 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් හෙවත් හෙක්ටයාර් 0.0257ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 224/183 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

09-629

---

## මහජන බැංකුව - ජාඇල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2004.10.11 දිනැති අංක 1602 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රන්වලගේ ජෝර්ජ් ප්‍රීමාස් සහ තෙල්ලඹුර ගමගේ ඉන්දික උදයන්ජනී යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ දාහත්දහස් හත්සිය එකොලහයි ශත විසිහතර (රු. 2,17,711.24) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.12.17 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් දෙලක්ෂ දාහත්දහස් හත්සිය එකොලහයි ශත විසිහතර (රු. 2,17,711.24) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එක රුපියල් දෙලක්ෂ දාහත්දහස් හත්සිය එකොලහයි ශත විසිහතර (රු. 2,17,711.24) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර රංජිත එස්. මහානාම විසින් එකී අංක 1602 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල නගර සභා බල සීමාවට අයත් වැවල ගමේ වරිපනම් අංක 06, තොලේවත්ත පළමු පටුමග යන ස්ථානයේ පිහිටි මූණමල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් 1996.11.22 වැනි දින මැන සකස් කරන ලද අංක 822 දරන පිඹුරට අනුව ලොට් අංක 5සී දරන කොටස සඳහා මායිම්, උතුරට : ලොට් අංක 5බී ද, නැගෙනහිරට : පාර, දකුණට : බී. එම්. මෙන්ඩිස්ට අයත් ඉඩම සහ ඇල ද, බස්නාහිරට : ඇල සහ ලොට් 5බී යන මායිම් තුළ පිහිටි අක්කර. 0, රූඩ්. 1, පර්චස් දශම තුන (අ. 0, රූ. 1, පර්. 0.3)ක් විශාල ඉඩම සහ ගහකොළ, ගොඩනැගිලි ඇතුළු සියළු දේද සමගින් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච් 48/184 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙකී පිඹුරේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටස්හි මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

09-628

---

## මහජන බැංකුව - කොට්ටාව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් 2009.07.31 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් චන්දිමා ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2007.09.24 දිනැති අංක 2826 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, උක්වත්තගේ කමලාවතී මිය, විතාන පතිරණ උන්නැහැලාගේ දෝන අනුෂා දිල්රුක්ෂි මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ අනූ එක් දහස් හයසිය හැටහයයි ශත හැත්තෑ එකක (රු. 3,91,666.71) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.12.20 දින සිට වර්ෂයකට සියයට විසිහය බැගින් (26%) රුපියල් තුන්ලක්ෂ අනූ එක් දහස් හයසිය හැටහයයි ශත හැත්තෑ එකක (රු. 3,91,666.71) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ අනූ එක් දහස් හයසිය හැටහයයි ශත හැත්තෑ එකක (රු. 3,91,666.71) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා විසින් එකී අංක 2826 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම පිහිටි හබන්හේන එස්ටේට් (හබන්හේන වත්ත) කියන ඉඩමට ඒ. හෙට්ටිගේ බලයලත් මිනින්දෝරු 1992.08.12 දින මැන සාදන ලද අංක 1408 දරන සැලැස්මේ ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 26 දරන ඉඩමට මායිම්, උතුරට : මෙම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : අංක 13 දරන අඩි 20ක් පළල පාර ද, එම ඉඩමේ කොටසක් ද, දකුණට : අංක 13 දරන කොටසට අයිති අඩි 5ක් පළල කාණුව ද, බස්නාහිරට : කුඹුර ද යන මායිම් තුළ පිහිටි පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු ආදී සියලු දේ.

එකී ඉඩමට යාම ඊම සඳහා අංක 1408 දරන සැලැස්මේ ප්‍රකාර බෙදා වෙන් කළ අංක 13 දරන බිම් තීරයේ ද, ඒ. ඊ. සී. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු 1990.02.23 දින මැන සාදන ලද අංක 1547 දරන සැලැස්මේ පෙන්වන කැබලි අංක 1 දරන බිම් තීරයේ ද පොදු ප්‍රවේශ මාර්ග අයිතිය ද සමග වේ.

මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 885/181 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කළාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

09-630

### මහජන බැංකුව - රක්වාන ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.27 පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජනත් ජයවර්ධන මහතා විසින් සහතික කරන ලද 2005.07.19 දිනැති අංක 1444 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම, ආරියප්පෙරුම රාමනායක අප්පුහාමිලාගේ දොන් ජයලත් අමරසිරි යන අයවළුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ අනූදහස් අනූ පහයි ශත හතලිහක (රු. 5,90,095.40) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.08.26 දින සිට වර්ෂයකට 22% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂ අනූදහස් අනූ පහයි ශත හතලිහක (රු. 5,90,095.40) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එකී අංක 1869 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුළු කෝරළේ, උඩපත්තුවේ, රක්වාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රඹුක ගමේ පිහිටි සයිප්‍රස් වත්ත (මානික්ක වත්ත) නමැති ඉඩමට බලයලත්ව මිනින්දෝරු බී. යූ. එස්. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද අංක 371/1 සහ 1999.02.20 දිනැති පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද කැබලි අංක 03 දරන බෙදූ ඉඩම් කැබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර ද, බස්නාහිරට : කැබලි අංක 02 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතයි දශම නමයක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බින්දුවයි හතරයි පහයි තුනක් (අ. 0, රූ. 0, පර්. 17.9ක් හෙවත් හෙක්ටයාර් 0.0453) විශාල ඉඩම හා ඒ තුළ පිහිටි සියලුම දේද වේ.

මෙය දැනට රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 252/201 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
සබරගමු කලාපය.

මහජන බැංකුව,
සබරගමු කළාප කාර්යාලය,
නව නගරය,
රත්නපුර.

09-633

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ගාල්ල, මහජන නොතාරිස් එන්. පී. ජී. චන්ද්‍රිකා මහත්මිය විසින් සහතික කරන ලද 2006.05.15 දිනැති අංක 1286 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.05.18 දින තෙක් පොලිය වශයෙන් රුපියල් හාරලක්ෂ පන්සිය හතලිස් හයයි ශත හැත්තෑතුනක (රු. 4,00.546.73) මුදලක් සමග රුපියල් තුන්ලක්ෂ හතලිස් දහස් නවසිය හැත්තෑඅටයි ශත විසිඅටක (රු. 3,40,978.28) මුදලක් මත වසරකට සියයට විස්සයි දශම හතයි පහ (20.75%) බැගින් පොලියක් ද, 2009.05.19 වැනි දින සිට ගෙවීම නිම කරන දිය තෙක් ගාල්ල උළුවිටිකේ, "සමන්ත" හි පදිංචි නාරංගොඩගේ සමන්ත සිරිමාන්න මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1286 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හාරලක්ෂ පන්සිය හතලිස් හයයි ශත හැත්තෑතුනක (රු. 4,00,546.73) මුදල සමග 2009.05.19 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, මාතර කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397) අධිකාරය හා එහි සංශෝධවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව ගාල්ල කඩවීදිය අධිශ්‍රේණි ශාඛාවේ ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාල්ල සතර මායිමේ, බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභා සීමාව තුළ උලුවිටිකේ පිහිටි බද්දේගම පාරේ වරිපනම් අංක 163/12 දරන පරකැටියෙගොඩකන්ද නොහොත් ලන්ද නමැති ඉඩමෙහි ලොට් 4 සහ 5 ලෙස සටහන් කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 සහ 5 එක්ව උතුරට : එම ඉඩමේ ලොට් අංක 10 සහ 11 සහ කහටගහවත්ත ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් අංක 3 ද, දකුණට : පුරුක්කුනේ අඩි පාර ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් අංක 6 ද, මායිම්ව බලයලත් මිනින්දෝරු ඩී. එස්. ගුණසේකර විසින් සාදන ලද අංක 1209A දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනයි පර්චස් තිස්නවයක (අ. 0, රූ. 3, පර්. 39) වපසරියකින් යුක්තවන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියළු දේ ද වේ.

මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A301/167 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ලොට් අංක 4 සහ 5 බලයලත් මිනින්දෝරු ඒ. එන්. ඩබ්. ලියනගේ විසින් මෑතකදී මැන සාදන ලද 2005 සැප්තැම්බර් මස 01 දිනැති අංක 3638 දරන පිඹුරෙහි පහත ආකාරයට විස්තර කොට ඇත.

ඉහත කී උලුවිටගේ පිහිටි පරකැටියේගොඩකන්ද නොහොත් ලන්ද නමැති ඉඩමෙහි අංක 3638 දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස සටහන් කර නිරූපනය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට : එම ඉඩමේම ලොට් අංක 10 සහ 11 ද, කහටගහවත්ත ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 3 ද, දකුණට : ගාල්ල බද්දේගම මහ පාර දක්වා අඩි 10 පළල පාර සහ මාර්ගය ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් අංක 6 ද මායිම්ව අංක 3638 පිඹුර ප්‍රකාර රූඩ් තුනයි පර්චස් තිස්නවයක (අ. 0, රූ. 3, පර්. 39) වපසරියකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ හා අනෙකුත් සියළු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. වී. එස්. වසන්ත,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
ගාල්ල කඩ වීදිය,
අධිශ්‍රේණි ශාඛාව.

09-691

---

## මහජන බැංකුව - පළමු නගර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.19 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. නන්දනී පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 1996.04.18 දිනැති අංක 2373 දරන උකස්කරය හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 1997.09.01 දිනැති අංක 5056 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, දොන් ප්‍රේමලාල් අතුකෝරළ මයා, ගීතා මංගලිකා රාජපක්ෂ මිය යන අය විසින් ගෙවීම් පැහැර ඇති බැවින් ද, එකී අංක 2373 දරන උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ පනස්හයදහස් හාරසිය විසි දෙකයි ශත හැටක (රු. 2,56,422.60) ක මුදලක් ද, ඉහත කී අංක 5056 දරන උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ හතලිස් නවදහස් හත්සිය විසිතුනයි ශත තිස්හතක් (රු. 1,49,723.37) බැංකුවට අයවීමට ඇති බැවින්, එකී දෙලක්ෂ පනස්හයදහස් හාරසිය විසිදෙකයි ශත හැටක (රු. 2,56,422.60) මුදල හා එක්ලක්ෂ හතලිස් නවදහස් හත්සිය විසිතුනයි ශත තිස්හතක මුදල සඳහා 1998.09.01 වැනි දින සිට වර්ෂයකට 23% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. නන්දනී පෙරේරා මහත්මිය 1996.04.09 වැනි දින සහතික කළ අංක 2373 දරන උකස්කරය හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එබ්. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් 1997.09.01 වැනි දින සහතික කළ අංක 5056 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, මීගහවත්ත ද, උඩුපිල ද, ගෝණාහේන ද යන ගම්වලට අසුව පිහිටි, පෙලෙන්ගහවත්ත සහ ගලහේන නමැති ඉඩමේ 4ඒ සහ 8ඒ දරන කොටස් දෙක ද, උඩුපිළ මූකලාන ද, ඊරියගහකුඹුරු, තලගහවත්ත ද යන ඉඩමෙන් බෙදා වෙන් කළ ඒ සහ බී දරන කොටස් ඒකාබද්ධ ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 38 දරන කොටසට පී. එල්. බී. නානායක්කාර බලයලයත් මිනින්දෝරු තැන මැන සාදන ලද අංක 8620ඒ සහ 1990.07.22 දිනැති පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : අංක 20 සහ 19 දරන කොටස් ද, නැගෙනහිරට : අංක 39 දරන කොටස ද, දකුණට : අංක 41 සහ 42 දරන කොටස් ද, බස්නාහිරට : ආර් 2 දරන කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම කොටස සහ ඊට අයත් වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දෙය ද වේ.

තව ද, එකී අංක 8620 දරන පිඹුරේ සඳහන් පාරවල් පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කොළඹ - උතුර.

කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කළාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

09-631

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක P. Q. 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මතර කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක P. Q. 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 ජූලි මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජෙනිවීව් පියුමිනි රණසිංහ විසින් ලියා සහතික කරන ලද මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන අංක 350 සහ 2005 ඔක්තෝබර් මස 20 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන දෙහිවල, කළුබෝවිල කඩවත පාරේ අංක 87/5ඒ දරන ස්ථානයේ පදිංචි ප්‍රසන්න සම්පත් හෙට්ටිආරච්චි යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.02.26 වැනි දිනට රුපියල් තිස්ලක්ෂ හැටහත්දහස් හයසිය අසූතුනකුත් ශත හැත්තෑහතරක (රු. 30,67,683.74) මුදලක් වර්තමානයේදී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් තිස්ලක්ෂ හැටහත්දහස් හයසිය අසූතුනකුත් ශත හැත්තෑහතරක (රුපියල් 30,67,683.74) මුදල සහ 2008.02.26 වැනි දිනට නිවාස ණය මත හිග මුල් මුදල වන රුපියල් විසිඅටලක්ෂ අනූහත්දහස් තිස්එකකුත් ශත හතළිහක (රු. 28,97,031.40) මුදල මත 2008.02.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27% බැගින් තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධ ව්‍යාවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද, එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි එම්. ඩබ්ලිව්. ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාවේ කළුබෝවිල පිහිටි ඇන්ඩර්සන් පාරේ, වරිපනම් අංක 65/12 දරන බක්මීගහකුඹුර මූනමල්ගකුඹුර සහ මීගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 33/2005 සහ 2005 සැප්තැම්බර් මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් බී නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු කේ. වී. එම්. ඩබ්ලිව්. සමරනායක විසින් මැන සාදන ලද අංක 2133 සහ 2004 මාර්තු මස 25 දිනැති පිඹුරේ ලොට් 4 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, දකුණට : අංක 2133 දරන එකී පිඹුරේ ලොට් 3 ද, බස්නාහිරට : ලොට් ඒ ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 33/2005 දරන පිඹුර අනුව පර්චස් නවයයි දශම තුනයි හතක (අ. 0, රූ. 0, පර්. 9.37) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය.

ඉහත කී ඉඩමට ඉහත සඳහන් අංක 350 දරන උකස් බැඳුම්කරයේ සවිස්තරව දක්වා ඇති මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගමේ ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

09-713

පීවී 10373.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "දෙශිකා එම්බ්‍රොයිඩරි සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2003.07.31 වැනි දින සංස්ථාපිත සමාගමක් වන දෙශිකා එම්බ්‍රොයිඩරි සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, දෙශිකා එම්බ්‍රොයිඩරි සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-559

පීවී 64142.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "වෙස්ටර්න් ඉන්ටීරියර්ස් ඩෙකර් (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.05.21 වැනි දින සංස්ථාපිත සමාගමක් වන වෙස්ටර්න් ඉන්ටීරියර්ස් ඩෙකර් (පීවීටී) එල්ටීඩී ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, වෙස්ටර්න් ඉන්ටීරියර්ස් ඩෙකර් (පීවීටී) එල්ටීඩී නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-562

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.